**සී/ස ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පෞද්ගලික) සමාගම - 2018**
---------------------------------------------------------------------------------

**1.1 මතය ව්‍යාචනය**

-----------------

**සී/ස ලංකා රාජ්‍ය තොරතුරු යටිතල පහසුකම් (පෞද්ගලික) සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.**

**1.2 මතය වියාචනය සඳහා පදනම**

------------------------------

**මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මම මතයක් ප්‍රකාශ නොකරමි.**

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

--------------------------------------------------------------------------------------------

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.**

**සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.**

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

--------------------------------------------------------------------------

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.**

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම හා ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතී රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙනයාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.77,340,402 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද දේපළ, පිරියත හා උපකරණ, රු.11,601,568 ක් ලෙස නැවත තක්සේරු කර තිබුණි. කෙසේ වෙතත්, ස්ථාවර වත්කම් ලේඛනයක් හා වත්කම් නැවත තක්සේරු කිරීමේ පදනම ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් විගණනයේදී එම ශේෂයන්ගේ නිරවද්‍යතාව තහවුරු කර ගැනීමට නොහැකි විය. | සටහන්කර ගතිමි. වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කරන ලදී. මෙහි විෂය පථය වූයේ වත්කම් හඳුනාගැනීම සහ ඉඩම් හෝ ගොඩනැගිලි තක්සේරු කිරීමත්ය. ඒ අනුව තක්සේරුකරු විසින් ඉදිරිපත් කරන ලද පොත් අගය තක්සේරු වටිනාකම ලෙස සලකන ලදී. | ස්ථාවර වත්කම් නැවත තක්සේරු කිරීමට අදාල වාර්තා හා ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 133(1) වගන්තිය | 2011 ජූලි 18 දින සමාගම පිහිටුවීමෙන් පසුව සමාගමේ වාර්ෂික මහාසභා රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් වාර්ෂික මහාසභා රැස්වීම නොපැවැත්විය.<br><br>2007 සිට 2015 දක්වා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සියල්ල අනුමත කිරීම සඳහා 2017 දී වාර්ෂික මහාසභා රැස්වීමක් කැඳවනු ලැබීය. | සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br>(i) 6.5.1 ඡේද | 2018 වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශන මාස 21 ක ප්‍රමාදයකින් පසු විගණනයට ඉදිරිපත් කර තිබුණ අතර ඒ සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | සටහන් කර ගතිමි. 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2020 සැප්තැම්බර් මාසයේදී විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද අතර, ප්‍රධාන මූල්‍ය නිළධාරී තනතුර මාස 09 ක පමණ කාලයක් පුරප්පාඩු වී තිබීම මේ සඳහා බලපා ඇත. | චක්‍රලේඛයේ ප්‍රතිපාදන ප්‍රකාරව ප්‍රමාදයකින් තොරව මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 3 සහ 4 ඡේද | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි. | LGII සමාගමට අදාල තීරණ ගැනීමේ කටයුතු මව් සමාගම ලෙස ICTA ආයතනය විසින් හසුරුවන බැවින් LGII මෙහෙයුම් සඳහා වෙනම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමක් සිදු නොවේ. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |
| (iii) 5.1 ඡේද | සමාගම විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2017 දී මව් සමාගම වන ICTA විසින් LGII සඳහා ආයතනික සැලැස්මක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කලද එවකට රේඛීය අමාත්‍යාංශය විසින් යෝජිත මෙහෙයුම් ප්‍රමාණය අඩු කිරීම නිසා සංවර්ධිත ආයතනික සැලැස්ම සම්මත කර ගැනීමට නොහැකි විය. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2018 වර්ෂය සඳහා සමාගම විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | LGII හි ක්‍රියාකාරී සැලැස්ම ICTA ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ ඇතුළත් කර ඇත. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සමාගමේ කාර්යසාධනය ඉහළ නංවා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. |

**2.** මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,133,327 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.357,100 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,490,427 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ව්‍යාපෘති වියදම් රු.15,571,543 කින් හා ප්‍රදාන රු. 12,240,994 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව, ලංකා රාජ්‍ය ජාලය සහ ලංකා ද්වාර මෙහෙයුම් කළමනාකරණය සහ නඩත්තු කිරීම සඳහා වගකීම සමාගමේ ප්‍රධාන අරමුණු විය. ඊට අදාල ව්‍යාපෘති කළමනාකරණ ක්‍රියාකාරකම් මව් සමාගම විසින් මෙහෙයවනු ලබන බව නිරීක්ෂණය වූ අතර සමාගම ව්‍යාපෘති මෙහෙයුම් සහ නඩත්තු කිරීම සඳහා සීමා වී තිබුණි. | සටහන් කරගතිමි. LGII මෙහෙයුම් එහි විධිවිධානවලට අනුව ක්‍රියාත්මක වේ. | සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුකූලව සමාගම කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ඉ - ශ්‍රී ලංකා (e – Sri Lanka) ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුදල් සපයන්නා වශයෙන් ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත ස්වාධීනත්වයක අවශ්‍යතාවය සඳහන් කිරීම නිසා 2003 ජුලි 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත මූල්‍ය හා පරිපාලන අංශයන් සඳහා සම්පූර්ණ ස්වාධීනත්වය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයට හිමි වී තිබුණි. කෙසේ වෙතත් එහි පරිපාලිතයන් වශයෙන් වර්තමානයේදී සමාගම සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ අරමුදල් මත යැපෙන නමුත් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පෙර පැවැති මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය තවදුරටත් අඛණ්ඩව පවතින බව නිරීක්ෂණය විය. | 2003 මැයි 27 දිනැති කැබිනට් සංදේශය හරහා මෙහෙයුම් ස්වාධීනත්වය ICTA ආයතනයට ලබා දී ඇති අතර අන්තර් අමාත්‍ය කමිටුව 2017 දී ICTA ආයතනයට මෙම පදනම මත දිගටම ක්‍රියාත්මක වියහැකි බවට එකඟ විය. | රජයේ ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ලබා ගන්නා ආයතනයක් වූ විට මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය තවදුරටත් අදාල වන්නේද යන්න සළකා බැලිය යුතුය. |
| (ආ) ව්‍යාපෘති සැලසුම් කිරීම, ගිණුම් පිළියෙල කිරීම, පරිපාලනය සහ මානව සම්පත් කළමනාකරණය ඇතුළුව සමාගමේ සියළුම කාර්යයන් මව් සමාගම විසින් මෙහෙයවනු ලැබුවද සමාගමේ කාර්යාල පරිශ්‍රය සඳහා සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි කුලිය රු. මිලියන 6.35 ක් වී තිබුණි. ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතියෙහි මෙහෙයුම් නිලධාරීන් පමණක් සමාගම් පරිශ්‍රයෙහි අනුයුක්තව සිටියද එම ව්‍යාපෘතියෙහි වැඩසටහන් සහ ව්‍යාපෘති කළමනාකරුවන් මව් සමාගමට අනුයුක්ත කර සිටින බැවින් එම ව්‍යාපෘතිය සඳහා වෙන්වූ සමාගමක් පිහිටුවීම ගැටළු සහගත විය. | 2020 දී අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද ICTA ආයතනයේ කැබිනට් සංදේශයට දැනටමත් කැබිනට් අනුමැතිය ලබා දී ඇත. මෙමගින් මතු වී ඇති ගැටළු විසඳීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග යෝජනා කර ඇත. | ඒකාබද්ධ අරමුදලින් ක්‍රියාත්මක වන සමාගමක් බැවින් පිරිවැය අවම වන ලෙස ක්‍රියාකළ යුතුය. |

**3.3** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2003 ජූනි 02** දිනැති අංක පීඊඩී/**12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | |
| (i) **9.2** වගන්තිය අනුව මානව සම්පත් අයවැය හා ඒකාබද්ධව මානව සම්පත් සැලසුම පිළියෙල කළ යුතු අතර සංවිධාන සැලැස්ම හා අනුමත කාර්ය මණ්ඩලය භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. | **ICTA** ආයතනයට (**LGII**) හි මෙහෙයුම් කටයුතු සඳහා සම්බන්ධතාවයක් ලබා දී ඇති අතර **LGII** සමාගමේ කාර්ය මණ්ඩලය එක් අවුරුදු කොන්ත්‍රාත් කාලයක් සඳහා පත් කරන බැවින් සමාගම විසින් අනුමත කාර්ය මණ්ඩල පද්ධතියක් පවත්වාගෙන යන්නේ නැත. | චක්‍රලේඛයේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) **9.3(1)** වගන්තිය අනුව එක් එක් තනතුරු සඳහා බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටියක් සමාගම විසින් සකස් කර නොතිබුණි. | වසර **01** ස්ථාවර කොන්ත්‍රාත්තු කාලයක් සඳහා පත්වීම් ලබාදෙන අතර අරමුදල් ප්‍රභවය රජයේ භාණ්ඩාගාරයට පැවරීමෙන් පසුව ද එම ක්‍රමවේදයට පැවතුනි. එසේම, **ICTA** ආයතනයට කැබිනට් සංදේශයක් මගින් මෙහෙයුම් කටයුතු සඳහා ස්වාධීනත්වය ලබා දී ඇති අතර **2020** නොවැම්බර් අනුමත කැබිනට් සංදේශයක් මගින් ඉහත කරුණු පිළිබඳව දැනටමත් අවධානය යොමු කර ඇත. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) අනුමත කාර්ය මණ්ඩලයක් සහ බඳවා ගැනීමේ පටිපාටියක් නොමැතිව කොන්ත්‍රාත් පදනම මත සියළුම සේවකයින් සහ උපදේශකයින් බඳවාගෙන වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | කාර්ය මණ්ඩලයට වසර **01** ස්ථාවර කොන්ත්‍රාත්තු කාලයක් සඳහා ලබා දී ඇති අතර අරමුදල් ප්‍රභවය රජයේ භාණ්ඩාගාරයට පැවරීමෙන් පසුව ද එම ක්‍රමවේදයට පැවතුනි. එසේම, මානව සම්පත් කළමනාකරණය කිරීම සඳහා කැබිනට් සංදේශයක් මගින් ස්වාධීනත්වය ලබා දී ඇති අතර අනුමත කැබිනට් සංදේශයක් මගින් ඉහත කරුණු පිළිබඳව දැනටමත් අවධානය යොමු කර ඇත. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |